## සබරගමුව පළාත් සභාව-2012

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට සබරගමුව පළාත් සභාවේ මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම

1.2.1 පළාත් සභා අරමුදල

සමාලෝචිත වර්ෂයේ පළාත් සභා අරමුදල් ගිණුම 2013 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කරන ලදී.

1.2.2 අනෙකුත් ගිණුම්

සමාලෝචිත වර්ෂයට අදාලව 2013 අප්‍රේල් 15 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | විසර්ජන ගිණුම් | 28 | 28 | - |
| (ii) | ආදායම් ගිණුම් | 01 | 01 | - |
| (iii) | පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 26 | 25 | 01 |
| (iv) | වාණිජ අත්තිකාරම් ගිණුම් | 05 | 02 | 03 |
| (v) | අරමුදල් ගිණුම් | 03 | 02 | 01 |
| (vi) | ප්‍රඥප්ති ගිණුම් | 03 | 03 | - |
| | | 66 | 61 | 05 |

1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

| | | වත්කම් | | වගකීම් | |
|---|---|---|---|---|---|
| | | අවස්ථා ගණන | අගය | අවස්ථා ගණන | අගය |
| | | | රු. | | රු. |
| (i) | ගිණුම්වල වැඩියෙන් දැක්වීම | 01 | 42,946,788 | - | - |
| (ii) | ගිණුම්වල අඩුවෙන් දැක්වීම | 01 | 4,106,828 | 01 | 9,296,426 |
| | එකතුව | 02 | 47,053,616 | 01 | 9,296,426 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සබරගමුව පළාතේ 1995 අංක 02 දරන අධිකරණ දඩ හැර වීමේ ප්‍රඥප්තියේ 02 වන වගන්තිය ප්‍රකාර දඩ හෝ දන්ඩන මුදල් අයකරගත් වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනයේ සිට අවුරුදු 02 ක කාලයක් ඇතුළත අදාල පළාත් පාලන ආයතනයේ ලිඛිත ඉල්ලීමක් මත පළාත් සභාව විසින් එම දඩ හෝ දන්ඩන මුදල් අදාල පළාත් පාලන ආයතනයට ගෙවිය යුතු වුවත්, 2012 වර්ෂයේ ලැබී තිබූ රු.78,957,373 ක් වූ (මුළු බදු නොවන ආදායමින් සියයට 16 ක්) උසාවි දඩ මුදල් වර්ෂයේ ආදායම ලෙස ගිණුම් ගත කර තිබුණි.

1.2.4 <u>නොසැසඳුනු පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 04 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.138,872,046 ක් වූ අතර, උපයෝගී ලේඛන/වාර්තා අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.231,828,038 ක් වුයෙන් රු.92,955,992 ක වෙනස සසඳා නොතිබුණි.

1.2.5 <u>ලැබිය යුතු ගිණුම්</u>

අවුරුදු 01ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.2,169,350 ක් විය.

1.2.6 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

(අ) <u>පිළිතුරු නොළත් විගණන විමසුම්</u>

2012 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 22 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.60,064,390 ක් විය.

(ආ) <u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ආයතන 05 කට අදාල එකතුව රු.4,096,323 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.2.7 <u>නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම</u>

පහත සඳහන් නීති, රීති රෙගුලාසිවලට අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2011 ජූනි 27 දින නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රය | 2012 පළාත් සභා ඡන්ද විමසීමේදී පළාත් සභාවේ අමාත්‍යාංශයක ගරු අමාත්‍යතුමා හා අමාත්‍ය කාර්යය මණ්ඩලය වෙත ලබා දී තිබූ නිල වාහන ආපසු භාර දීමේදී වාහන 4ක් දින 48ක් සහ වාහන 3ක් දින 47ක් නියමිත දිනට වඩා ප්‍රමාද වී භාර දී තිබුණු අතර ඉන් වාහන 5 කට විවිධ අලාභ සිදු වී තිබුණි. එමෙන්ම වාහන 5 ක අමතර කොටස් අඩුවෙන් භාර දී තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2006 පෙබරවාරි 10 දිනැති අංක සිඑස්ඒ/1/1/20 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛයේ 3 ඡේදය සහ අ ඇමුණුමේ උපලේඛන 111 | ගරු පළාත් අමාත්‍යවරුන්ගේ විදේශ ගමන් අනුමත කිරීම ගරු ආණ්ඩුකාරවරුන් විසින් සිදුකළ යුතු වුවද, 2012 මාර්තු 22 සිට 25 දක්වා කියුබාවේ පැවැති කියුබා මිත්‍ර සංගමයේ සැසි වාරය සඳහා අමාත්‍යවරයකු ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගැනීමකින් තොරව එම සමුළුව සඳහා විදේශ ගත වී තිබුණු අතර රු.228,750 ක් ඒ සඳහා වැය කර තිබුණි. |
| (ඇ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 (iv) ඡේදය | පළාත් සභා සංකීර්ණයේ ස්ථාපිත ඇඟිලි සලකුණු යන්ත්‍රයේ මුද්‍රිත සටහන් නොසලකා හරිමින් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව තුළ නඩත්තු කරන පැමිණීමේ හා පිටවීමේ අත්සන් ලේඛනය අනුව එකතුව රු.162,710 ක අතිකාල දීමනා ගෙවා තිබීම, නිලධාරීන් 06 දෙනෙකු සාමාන්‍ය රාජකාරි වේලාවෙන් පසුව සාමාන්‍ය රාජකාරි ඉටු කිරීම වෙනුවෙන් එකතුව රු.45,018 ක් අතිකාල දීමනා ගෙවා තිබුණි. 2012 වර්ෂයට අදාලව පැමිණීමේ අත්සන් ලේඛනය අවස්ථා 161 ක දි පසුව වෙනස් කර තිබුණු හෙයින් මෙම අතිකාල දීමනා ගණනය කිරිමේ නිවැරදිතාවය පිළිබඳව විගණනයට සෑහීමකට පත් වීමට නොහැකි විය. |
| (ඈ) | 2001 මාර්තු 28 දිනැති හා අංක 2001/01 දරන පළාත් සභා සහ පළාත් පාලන චක්‍රලේඛයේ අංක 06 ඡේදය | 2012 වර්ෂයේ මන්ත්‍රීධුරය අහෝසි වු මන්ත්‍රීවරුන් 12 දෙනෙකුට අදාලව එකතුව රු.1,418,600 ක් වු ණය අත්තිකාරම් මුදල් පළාත් සභාව විසුරුවා මාස 06 ක් ගත වී තිබුණ ද, 2012 දෙසැම්බර් 31 දින වන විටත් අය වී නොතිබුණු අතර, එදිනට හිඟහිටි පොලී මුදල රු.29,790 ක් වී තිබුණි. |
| (ඉ) | 2008 ජුලි 28 දිනැති අංක ආකා/10/7/ඒ/8 දරන පළාත් ආණ්ඩුකාර ලේකම්වරයාගේ ලිපිය | සබරගමුව පළාතේ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ 2012 වාර්ෂික සම්මේලනය වෙනුවෙන් එකතුව රු.34,350 ක් සහභාගීත්ව දීමනා ලබාගෙන තිබු පළාත් සහ කළාප අධ්‍යාපන කාර්යාල නිළධාරීන් 39 දෙනෙකු විසින් ඊට අතිරේකව එකතුව රු.80,987 ක මුදලක් සංයුක්ත දීමනා ලෙස ද ලබා ගෙන තිබුණි. |
| (ඊ) | 2008 සැප්තැම්බර් 15 දිනැති හා අංක 2008/35 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 11.1 වගන්තිය | මුදල් වැයකිරීම පාසල් සංවර්ධන කමිටුවේ තීරණයක් මත සිදුකල යුතු වුවත්, බලංගොඩ කලාපයේ විද්‍යාලයක සනීපාරක්ෂක වැටුප් ගෙවීමේදී අවස්ථා 25 ක දී එකතුව රු.83,600 ක් වූ වැටුප් මුදල පාසල් සංවර්ධන කමිටුවේ |

| | |
|---|---|
| | අනුමැතියකින් තොරව ගෙවා තිබුණු අතර සනීපාරක්ෂක හා ආරක්ෂක වැටුප් ගෙවීමේදී පුද්ගලයින් දෙදෙනෙකු වෙනුවෙන් එක් චෙක්පතකින් වැටුප් ගෙවා තිබූණි. |
| (උ) 2007 පෙබරවාරි 28 දිනැති අංක සීඑස්ඒ/පී1/40 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛයේ (iii)ඡේදය | සබරගමුව පළාතේ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික සම්මේලනය 2011 සහ 2012 වර්ෂයන් හි දී නුවරඑළිය කළාප අධ්‍යාපන කාර්යාලයේ පවත්වා තිබූ අතර, නවාතැන් ගාස්තු ලෙස එකතුව රු.436,500 ක් වූ මුදල් නුවරඑළිය පෞද්ගලික හෝටලයක් වෙත ගෙවා තිබුණි. |
| (ඌ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ | |
| (i) 2.14.1 මාර්ගෝපදේශය | රේඛීය අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව රු.22,132,000 ක් වටිනා වෛද්‍ය උපකරණ 06 ක් මිල දී ගෙන පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් බෙදා හැර තිබුණි. |
| (ii) 5.4.8 මාර්ගෝපදේශය | එකතුව රු.3,576,000 ක් වටිනා වෛද්‍ය උපකරණ 20 ක් මිලදී ගැනීමේදී කාර්ය සාධන ඇපකරයේ වලංගු කාලය ඉක්මවා සපයා තිබූ අතර, කාලය දීර්ඝකරවා ගැනීමට හෝ ඒ සඳහා ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. |
| (එ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ <u>මුදල් රෙගුලාසි සංග්‍රහය</u> | |
| (i) මු. රෙ. 177 | පළාත් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් ආයතන 03 ක් වෙත ලැබී තිබුණු එකතුව රු.917,133 ක් වූ මුදල් දින 03 සිට 44 දක්වා කාල ප්‍රමාදයකින් පසුව බැංකු ගත කර තිබුණි. |
| (ii) මු. රෙ. 571 | පළාත් සභාවේ අමාත්‍යාංශ 03 ක වසර දෙකක කාලය ඉක්මවා තිබුණු එකතුව රු.7,954,044 ක තැන්පතු මුදල් සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iii) මු. රෙ. 880 සහ රජයේ නිලධාරින්ගේ ඇප ආඥා පනතේ 612 වන අධිකාරිය | ආයතන 04 ක ඇප තැන්පත් කළ යුතු වූ නිලධාරීන් විසි අට දෙනෙකු නියමිත පරිදි ඇප තැන්පත් කර නොතිබුණි. |

(ඒ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ සබරගමුව පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහය

(i) මූල්‍ය රීති අංක 86.4 හා 86.6

විදුහල්පති විසින් සහතික කරන ලද ඉන්වෙන්ටරි සහතිකය ඇතුළත්ව නොතිබූ එකතුව රු.1,984,540 ක් වූ ළදරු පුටු 2962 ක් සඳහා ද එකතුව රු.2,089,740 ක් වූ ළදරු මේස 1201 ක් සඳහා ද ප්‍රධාන අමාත්‍යාංශය විසින් ගෙවීම් සිදුකර තිබුණි.

(ii) මූල්‍ය රීති 261.2.2

2009 වර්ෂයේ සිට 2012 වර්ෂයේ ඔක්තෝබර් මස දක්වා අවස්ථා 45 ක දී ලබා දුන් එකතුව රු. 2,297,000 ක් වූ අත්තිකාරම් 2013 පෙබරවාරි 11 වන විට ද, 2012 අප්‍රේල් 30 සිට 2012 ජුනි 11 දක්වා අවස්ථා 04 ක දී ලබා දුන් එකතුව රු.400,000 ක අත්තිකාරම් 2012 අගෝස්තු 14 වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම ලබා දී තිබුණු අත්තිකාරම් මුදල් පියවීමට පෙර අවස්ථා 54 ක දී එකතුව රු.4,590,486 ක අත්තිකාරම් නැවත නිකුත් කර තිබුණු අතර කෑගල්ල නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා කාර්යාලයේ අවස්ථා 08 ක දී ලබා ගන්නා ලද එකතුව රු.318,400 ක් දින 30 ට වැඩි කාල පමාවකින් යුක්තව පියවීම සිදුකර තිබීමද අවස්ථා 05 කදී එකතුව රු.102,070 ක් මුදල් අදාල කාර්යය සඳහා භාවිතා නොකර මාස 1-8 ත් කාලයක් අත රඳවා තබා ගෙන සම්පූර්ණ මුදලම පියවා තිබීමද නිරීක්ෂණය විය.

(ඔ) අධ්‍යාපන ගුණාත්මක යෙදවුම් මිලයට ගැනීම හා බෙදා හැරීම මාර්ගෝපදේශ අත්පොත

(i) 22 පරිච්ඡේදය

සෑම වර්ෂයකම ආරම්භයේ සිට සිව් මසක් අවසානයේදීම ඊළඟ මස 10 වන දිනට පෙර ගුණාත්මක අරමුදල් යෙදවූ ආකාරය පිළිබඳ වාර්තාවක් කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කල යුතු වුවද, 2012 වර්ෂය සඳහා කෑගල්ල දිස්ත්‍රික්කයේ පාසල් 150 ක් විසින් එසේ කටයුතු කර නොතිබුණි.

(ඕ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහයේ XXX පරිච්ඡේදයේ 1.2 සහ 1.3 වගන්තිය

කළාප අධ්‍යාපන කාර්යාල 02 කට අදාලව පාසල් 02 ක වැසිකිළි පහසුකම් සැපයීමේ කර්මාන්තයට ගෙවීම් කිරීමේ දී රු.1,196,419 ක් විදුහල්පතිවරයාට ද රු.57,346 ක රැඳවුම් නියෝජ්‍ය විදුහල්පතිවරයාට ද ගෙවා තිබුණි.

2. ආදායම් කළමනාකරණය

(අ) 2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා බදු ආදායම සහ බදු නොවන ආදායම පහත පරිදි වේ.

| වර්ෂය | බදු ආදායම | බදු නොවන ආදායම |
|---|---|---|
| | රු. | රු. |
| 2007 | 880,090,883 | 255,638,683 |
| 2008 | 1,012,846,946 | 251,306,994 |
| 2009 | 1,146,644,488 | 271,623,594 |
| 2010 | 1,382,363,156 | 321,209,919 |
| 2011 | 1,943,637,444 | 416,079,145 |

(ආ) පළාත් සභාවේ විවිධ ආයතන විසින් එකතු කරගනු ලබන ආදායමට අදාල හිඟ හිටි බදු වශයෙන් එකතුව රු.5,596,129 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආයතනය | බදු වර්ගය | හිඟ හිටි ආදායම |
|---|---|---|
| | | රු. |
| යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | වාර්ෂික බදු, එළදා බදු සහ ජල බදු | 5,132,472 |
| දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | වාර්ෂික බදු | 68,759 |
| දැරණියගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | වාර්ෂික බදු | 194,347 |
| දැරණියගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ජල බදු | 200,551 |
| එකතුව | | 5,596,129 |

(ඇ) පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් පිළිබඳ වාර්තාව අනුව බදු වර්ග 04 කට අදාලව එකතුව රු.34,871,991 ක් වූ හිඟ බදු ආදායම් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.578,643,467 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,056,423,606 ක් විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.477,780,139 කින් පිරිහීමක් නිරීක්ෂණය විය.

3.2 පළාත් සභාවට එරෙහිව හෝ පළාත් සභාව විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු 10 කට එරෙහිව පනවා තිබූ නෛතික සිද්ධි 79 ක් සහ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 02 ක් විසින් පනවා තිබූ නෛතික සිද්ධි 05 ක් 2012 දෙසැම්බර් 31 දින වන විට විභාග වෙමින් පැවතුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

රජයේ ප්‍රදාන

පළාත් සභා සංවර්ධන වැඩ යෝජනා සඳහා ලැබී තිබූ ප්‍රතිපාදනයන් සහ වැය කිරීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | ප්‍රභවය | වර්ෂයේ ලැබීම් | පළාත් සභා අරමුදලින් මාරු කිරීම් | විශේෂ ව්‍යාපෘති යටතේ පෙර වර්ෂ වල ලැබුණු මුදලින් ඉතිරි වූ මුදල් | වියදම |
|---|---|---|---|---|---|
| | ------------ | ------------------ | ----------------- --- | ------------------ | ------------------ |
| | | රු. | රු. | රු. | රු. |
| (අ) | උපමාන පාදක ප්‍රදාන | 197,391,000 | 143,650,000 | - | 350,890,843 |
| (ආ) | පළාත් නිශ්චිත ප්‍රදාන | 694,879,000 | - | - | 683,625,457 |
| (ඇ) | ලෝක බැංකු | 115,000,000 | - | - | 2012 ඔක්තෝබර් මස ප්‍රතිපාදන ලැබීම නිසා වියදම් කර නැත |
| (ඈ) | JICA ප්‍රදාන | 2,303,000 | - | - | 2,303,000 |
| (ඉ) | විශේෂ ව්‍යාපෘති (රේඛීය අමාත්‍යාංශ) | 8,000,000 | - | 164,755,875 | 166,265,711 |

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) දෙහිඕවිට අධ්‍යාපන කලාපයේ වැසූ පාසල් 21 කට අදාලව උපකරණ, ලී බඩු, ගුණාත්මක යෙදවුම්, පාසල් සංවර්ධන සමිති බැංකු ගිණුම් සහ අතැති මුදල් විධිමත්ව අදාල කලාප කාර්යාලය විසින් භාරගෙන නොතිබුණු අතර, මාවනැල්ල අධ්‍යාපන කලාපයේ වැසූ පාසල් 10 කට අයත් ඉඩම් ගොඩනැගිලි ප්‍රාදේශීය ලේකම් වෙත භාරදීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පළාත් මාර්ග කාපට් කිරීම හා නිම නොවූ ව්‍යාපෘති සංවර්ධන වැඩසටහන 2011 යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ කාපට් කිරීම සඳහා තෝරා ගෙන තිබූ මාර්ග සම්බන්ධයෙන් 2011 ජුනි 17 දින කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති සාකච්ඡාවේදී ගත් තීරණය අනුව කාපට් කිරීම සඳහා තෝරා ගෙන තිබුණු මාර්ග වල පළාත් සභාව විසින් ඉදිකිරීම් කටයුතු සිදුකර ඇති කොටස් ඉවත් කර ඉතිරි කොටස් සඳහා ඇස්තමේන්තු සකස් කිරීම යෝග්‍ය බව තීරණය කර තිබුණද 2010 හා 2011 වර්ෂ වලදී පළාත් මාර්ග අමාත්‍යාංශයේ ප්‍රතිපාදන වලින් රු.15,244,063 ක් වැය කර රඹුක්කන විධායක ඉංජිනේරු කාර්යාලය මඟින් නඩත්තු කර තිබූ මාර්ග 08 ක් එම නඩත්තු කල කොටස් ඉවත් නොකර කාපට් කිරීමේ ව්‍යාපෘතිය සඳහා තෝරා ගෙන තිබුණි.

(ඇ) පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාවට අදාලව එකම චෝදනාවක් සම්බන්ධයෙන් සභාපතිතුමා ඇතුළු නිලධාරින් 11 දෙනෙකුට 2009 වර්ෂයේ දී චෝදනා නිකුත් කර තිබුණ ද 2013 පෙබරවාරි 27 දින ඉන් එක් නිලධාරියෙකු නිදහස් කර ඇති නමුත් අනෙක් චූදිතයන් 10 දෙනා සම්බන්ධ විනය කටයුතු විගණිත දිනය වූ 2013 මැයි 23 වන විට ද අවසන් වී නොතිබුණි.

4.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

(අ) පළාත් මාර්ග අමාත්‍යාංශය විසින් 2011 වර්ෂයේදී රු.670,000ක් වැය කර සුන්දර සබරගමුව නමින් කෘතියක් එළිදක්වා තිබුණද 2013 මැයි මස 30 දින වන විටත් එම කෘතියෙහි පිටපත් 1000 කින් පිටපත් 621 ක් බෙදා හැර නොතිබුණි.

(ආ) 2012 අප්‍රේල් බක්මහ උළෙල පැවැත්වීම සඳහා ක්‍රීඩා සමාජ 295 ක් වෙනුවෙන් එකතුව රු.2,950,000ක ආධාර මුදලක් ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මඟින් වැයකර තිබුණු අතර, ඒ සඳහා ක්‍රීඩා සමාජ තෝරා ගැනීමේ දී කෑගල්ල දිස්ත්‍රික්කයේ ක්‍රීඩා සමාජ 294 ක් තෝරාගෙන තිබුණි. ආධාර ලබා දී තිබූ ක්‍රීඩා සමාජ 14 ක් ලියාපදිංචි ඒවා නොවන අතර ක්‍රීඩා සමාජ 06ක අංක පැහැදිළි නොවිය.

(ඇ) බලංගොඩ අධ්‍යාපන කලාපයේ විද්‍යාලයක 2012 වර්ෂයේ පළමු ශ්‍රේණියට ඇතුල් කරන ලද සිසුන් 125 දෙනෙකුගේ දෙමාපියන්ගෙන් දූවිලි ව්‍යාපෘතිය නම් ව්‍යාපෘතියක් සඳහා රු.369,000 ක් එකතු කර තිබූ අතර විගණිත දිනය වූ 2012 නොවැම්බර් 15 දින වනවිට රු.17,500 ක වියදමක් දැරීම හැර කිසිදු කාර්යයක් ව්‍යාපෘතිය වෙනුවෙන් ඉටුකර නොතිබුණි. එසේම අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2008 සැප්තැම්බර් 15 දිනැති අංක 2008/35 දරන චක්‍රලේඛයේ 10.4 ප්‍රකාරව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් ලබාගත යුතු අනුමැතිය ද ලබාගෙන නොතිබුණි.

(ඈ) ඇඹිලිපිටිය විධායක ඉංජිනේරු කාර්යාලය වෙත ලැබී තිබුණු රු:65,880ක් වටිනාකමැති ලීටර් 180 තාර බැරල් හතරක් වසරක පමණ කාලයක සිට කාර්යාල භූමියේ තබා ඇති අතර එකී බැරල් සිදුරු වී තාර ගලා යමින් තිබුණද එය ආරක්ෂා කර ගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබූ බැව් 2013 ජනවාරි 23 දින කරන ලද භෞතික විගණන පරීක්ෂාවේදී අනාවරණය විය.

(ඉ) ආණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ වවුචර් වලට අනුව ලැබී තිබූ පොත් සහ නිකුත් කිරීමේ ලේඛනය අනුව නිකුත් කිරීම් සලකා බැලූ විට 2012 ඔක්තෝබර් 12 දින වන විටත් අදාල අංශ වෙත බෙදා හැර නොතිබුණු එකතුව රු.1,800,359 ක් වටිනා පොත් 40816 ක් නිරීක්ෂණය විය.

(ඊ) 2011 වර්ෂයේ දී රත්නපුර අධ්‍යාපන කළාපයේ විද්‍යාලයක ගුරු භවතුන් තිදෙනෙකු විසින් පාසලට පැමිණ ඇති දිනයන්ගෙන් එකදු දිනයකදී වත් නියමිත වේලාවට සේවයට වාර්තා කර නොතිබූ අතර, පාසල පවත්වා තිබූ දින 191 න් දින 44 සිට දින 81 1/2 ක් දක්වා දින ගණනක් පළමු කාලපරිච්ඡේදය ද , දින 54 සිට දින 92 දක්වා වූ දින ගණනක් දෙවන කාල පරිච්ඡේදය ද අභිමිවන ආකාරයට සේවයට වාර්තා කරමින් ප්‍රමාද කාලය නොසලකා හැර පැමිණීමේ ලේඛන හා පන්ති වාර්තා පොත් වල ව්‍යාජ සටහන් තබමින් අක්‍රීය කාලයන් සඳහා ද වැටුප් ලබා තිබුණි.

(උ) බලංගොඩ අධ්‍යාපන කළාපයේ මධ්‍ය මහා විද්‍යාලයක ආපන ශාලාව බදු දීමෙන් 2012 දෙසැම්බර් 07 දින වනවිට පාසලට ලැබිය යුතු රු.108,000 ක මුදල 2013 මැයි 13 දින වන විටද අයකර ගෙන නොතිබුණි.

(ඌ) කෑගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයේ රු.183,938 ක් වටිනා හානිවීම් 21 ක් සම්බන්ධව ලිපිගොනු වල පවතින අඩුපාඩු හේතුවෙන් හානි ප්‍රතිපූර්ණය හෝ කපා හැරීම් සිදු කර නොහැකිව පැවතුණි.

(එ) විශේෂ ව්‍යාපෘති සඳහා රේඛීය අමාත්‍යාංශ වලින් 2012 වර්ෂයට පෙර වර්ෂයන්හි දී ලැබී තිබූ අග්‍රිමවලින්, රු.7,437,813 ක්, එම අග්‍රිම නිකුත් කළ පළාත් සභාවේ අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු විසින් 2012 දෙසැම්බර් 31 දිනට නැවත පළාත් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබීමෙන් ඇස්තමේන්තුගත කරන ලද ව්‍යාපෘතීන් වර්ෂයකට වැඩි කාලයක් ප්‍රමාද වී තිබූ අතර, එම ව්‍යාපෘතීන් කාලීනව සිදු නොකිරීම විගණනයේ දී නිරීක්ෂණය විය.

4.4 <u>මතභේදයට තුඩු දෙන ගනුදෙනු</u>

සබරගමුව පළාත් සභාවේ ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයට අයත් මිට්සුබිෂි පැජරෝ වර්ගයට අයත් ජීප් රථයේ වාහන ලියාපදිංචි කිරීමේ පොත අනුව 1994 අගෝස්තු 23 දින දක්වා පළාත් ඉඩම් කොමසාරිස් ජනරාල් සතුව පැවතියද, යථෝක්ත දින හා 2001 දෙසැම්බර් 12 යන දිනයන්හි පෞද්ගලික පාර්ශවකරුවන් වෙත හිමිකම් පැවරී තිබුණද වර්තමානයේදීත් යථෝක්ත රථය ඉඩම් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් භාවිතා කරන බවත් එය රජයේ වාහනයක් බැවින් පෙර කී පැවරුම් කටයුතු ප්‍රායෝගිකව සිදු විය නොහැකි වන බැවින් මේ සම්බන්ධයෙන් කිසියම් අක්‍රමිකතාවක් සිදු වී ඇති බැව් විගණනයේ දී නිරීක්ෂණය විය.

4.5 <u>අරමුදල් ඌන උපයෝජනය</u>

රත්නපුර දිස්ත්‍රික්කයේ පාසල් 122 ක එකතුව රු.22,144,105 ක ගුණාත්මක අරමුදල් භාවිතයකින් තොරව බැංකු ගිණුම් වල රඳවා තිබූ අතර ආයතන 02 ක එකතුව රු.390,800 ක් වූ මුදල් අදාළ අරමුණට යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

4.6 <u>නිසි අධිකාරි බලය නොලත් ගනුදෙනු</u>

දුම්රිය දෙපාර්තමේන්තුව සතුව තිබූ ඉඩම් කොටස්වල අනවසර පදිංචිකරුවන් 63 දෙනෙකුට දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් විසින් වාර්ෂික බලපත්‍ර නිකුත් කර තිබුණු අතර, තවත් අනවසර පදිංචිකරුවන් 73 දෙනෙකුට ස්ථිර බලපත්‍ර ද නිකුත් කර තිබුණි. එහෙත් එම ඉඩම් කොටස්වල අයිතිය දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ප්‍රාදේශීය ලේකම් වෙත පැවරීම පිළිබඳ කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවුණි.

4.7 <u>නිෂ්ක්‍රීය ඌණ උපයෝජිත වත්කම්</u>

(අ) පහත විග්‍රහ කර ඇති පරිදි භෞතික සම්පත් නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණ වල දී නිරීක්ෂණය විය.

| | වත්කම් ස්වභාවය | සංඛ්‍යාව/වර්ග ප්‍රමාණය | වටිනාකම රු. | නිෂ්ක්‍රීයව පැවති කාලය |
|---|---|---|---|---|
| (i) | ගොඩනැගිලි | 18 | ගණනය කළ නොහැක. | ලබා ගත නොහැක. |
| (ii) | වාහන | 2 | ගණනය කළ නොහැක. | මාස 05 - මාස 10 |
| (iii) | යන්ත්‍රෝපකරණ | 4 | 40,050 | අවුරුදු 01 - අවු 22 |

(ආ) වත්කම් කළමනාකරණය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(i.) රුපියල් මිලියන 80 ක පමණ වියදමක් දරා ඉදිකරන ලද රත්නපුර මහජන පුස්තකාල ගොඩනැගිල්ල 2010 මාර්තු 30 දින ඉදිකිරීම් වැඩ අවසන් කර තිබුණ ද, 2012 දෙසැම්බර් 20 දින දක්වාම ප්‍රයෝජනයට ගැනීමකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.

(ii.) සමාජ සුභසාධන , පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය විසින් 2009,2010 හා 2011 වර්ෂයන්හි පවත්වන ලද සායනවල දී බෙදා දීමට වෙන් කළ ඇස් කණ්නාඩිවලින් රු.377,790 ක් වටිනා ඇස් කණ්නාඩි 582 ක් ඉතිරිව ගබඩාවේ අසුරා තිබූ අතර, එම ඇස් කණ්නාඩි කල් ඉකුත් වී ඇති බැවින් පාවිච්චියට ගත නොහැකි තත්ත්වයක ඇති බව ගබඩා පරීක්ෂාවේ දී තහවුරු විය.

(iii.) 2011 සහ 2012 වර්ෂයන්හිදී පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් මිලදී ගත් එකතුව රු.26,264,266 ක් වූ වෛද්‍ය උපකරණ 48 ක්ද වටිනාකම සොයා ගත නොහැකි වෛද්‍ය උපකරණ 04 ක්ද 2013 මැයි 30 දින වන විට පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ගබඩාවේ, රෝහල් හා මධ්‍යම බෙහෙත් ශාලා ගබඩාවන්හි භාවිතයෙන් තොරව පැවතුණි.

4.8 <u>ආර්ථික නොවූ ගනුදෙනු</u>

සබරගමුව පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යතුමාගේ නිර්දේශයන් මත රු.967,500 ක් වැය කර වානේ අල්මාරි 75 ක් මිල දී ගෙන ගොවි සංවිධාන වෙත බෙදා දී තිබූ අතර, ඉන් වානේ අල්මාරි 10 ක් සම්බන්ධව කරන ලද භෞතික පරීක්ෂාවේ දී අල්මාරි 09 ක්ම අදාල කාර්යය සඳහා ඵලදායි ලෙස යොදාගෙන නොතිබුණි.

4.9 හඳුනා ගන්නා ලද පාඩු

සබරගමුව පළාත් සභාවේ ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණු ජීප් රථයක් 2001 නොවැම්බර් 30 දින පෞද්ගලික ඡන්ද ප්‍රචාරක කටයුතුවලට යොදා ගෙන තිබියදී අනතුරින් පළාත් සභාවට රු. 216,088ක පාඩුවක් සිදු වී තිබුණත්,එම පාඩුව අදාල අයගෙන් අයකර නොතිබුණි.

4.10 භෞතික සම්පත් ඌණතාවය

පළමු වසරේ සිට 11 වසර දක්වා පන්ති පවත්වාගෙන යනු ලබන බලංගොඩ කලාපයේ විද්‍යාලයක විද්‍යාගාරයක් හා පුස්තකාලයක් නොමැති අතර 10 හා 3 ශ්‍රේණි පවත්වන පන්ති කාමර වල වහලය පිලිසකර නොකිරීම හේතුවෙන් වර්ෂාව පවතින අවස්ථා වල අධ්‍යයන කටයුතු කරගෙන යාමේ අපහසුතාවය විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

4.11 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

(අ) ඉදිකිරීම්

පළාත් සභාවේ විවිධ අමාත්‍යාංශ සහ ආයතන විසින් කරනු ලැබූ ඉදිකිරීම් සම්බන්ධ නියැදි විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | කර්මාන්තයේ නම | ක්‍රියාත්මක ආයතනය | 2012.12.31 ට වියදම | පරීක්ෂණ දිනය | නිරීක්ෂණය වු අඩුපාඩු |
|---|---|---|---|---|---|
| | | | රු. | | |
| (i) | රංවල කුලරත්න ළමා නිවාසයේ ප්‍රවේශ මාර්ගය හා පැතිබැම්ම ඉදිකිරීමේ කර්මාන්තය | කර්මාන්ත අමාත්‍යාංශය | 831,392 | 2012.09.22 | කොන්ක්‍රීට් මතුපිට පුපුරා තිබීම, පැති බැම්මේ කපරාදු ගැලවී යාම, පැති බැම්ම එක පැත්තකට ඇලවී තිබීම. |
| (ii) | කොහිලදෙනිය මැදිකැලේ මාර්ගයේ කි.මී. 0.00 සිට කි.මී. 2.35 දක්වා සංවර්ධනය කිරීම | පළාත් මාර්ග අමාත්‍යාංශය | 1,652,075 | 2012.12.24 | නියමිත ප්‍රමිතියට තාර භාවිතා නොකිරීම නිසා මාර්ගයේ මතුපිට පෘෂ්ඨයේ වලවල් සෑදී තිබීම , මාර්ගය දෙපස අයින කැඩී ගොස් තිබීම මාර්ගයේ තිබිය යුතු සාමාන්‍ය පළල මීටර් 2.35 ට අඩු ස්ථාන පැවැතීම. |
| (iii) | බානගොඩ කෙම්පනාවත්ත මාර්ගයේ කි.මී.0.00 කි.මී.0.5 දක්වා සහ කි.මී.3.00 සිට කි.මී.8.2 | රත්නපුර විධායක ඉංජිනේරු කාර්යාලය | 19,603,535 | 2013.08.08 | රු.1,049,400 ක වියදමකින් ඉදිකර තිබූ බෝක්කු නිසි ප්‍රමිතියට ඉදි නොකිරීම, බෝක්කු සඳහා ඉදිකළ පැති බැම් 07 ක් පුපුරා කැඩී තිබීම, |

| | | | | | |
|---|---|---|---|---|---|
| | දක්වා වැඩි දියුණු කිරීමේ කර්මාන්තය | | | | පැති බැම්වල බදාම තට්ටු බොල් වී තිබීම, මාර්ග තලයට යොදා ඇති කොන්ක්‍රීට් කැඩී යාමට ලක්ව තිබීම. |
| (iv) | රත්තුරුගල සමන්සිරිගම හරහා රත්ගහ මාර්ගය ගල් අතුරා තාර දමා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය | ප්‍රාදේශීය ලේකම් රත්නපුර | 83,681 | - | මාර්ගයේ බොහෝ ස්ථාන ගිලා බැසීම සහ වලවල් සෑදී තිබීම, මාර්ගයේ පාද තලයට යොදන ලද සක්ක ගල් මතු වී තිබීම. |
| (v) | කහවත්ත කට්ටංගේ මාර්ගය කි.මී.2.00 සිට කි.මී.6.27 දක්වා වැඩි දියුණු කිරිම | පැල්මඩුල්ල විධායක ඉංජිනේරු කාර්යාලය | 11,177,683 | 2012.02.17 | මාර්ගයේ කි.මී.2.5 , 3.5, 5.5 පමණ ස්ථානයන්හි මී. 1.5xමී.1.5 ප්‍රමාණයේ වලවල් සෑදී තිබුණි. |

(ආ) අළුත් නුවර දේවාලය දක්වා වූ මාර්ගයේ අවශ්‍ය ස්ථාන වැඩිදියුණු කිරීමේ කර්මාන්තය සඳහා රු.499,109 ක් වැය කර තිබුණි. එකී මාර්ගය 2012 ජූලි 25 දින විගණන පරික්ෂාවේදී දේවාලයට පිවිසෙන මාර්ගය කඩතොළු වී කුඩා වලවල් සහිතව අළුත්වැඩියා කළ යුතු මට්ටමේ තිබියදීත් එකී මාර්ගය සංවර්ධනය නොකර වෙනත් මාර්ගයක ස්ථාන තුනක අළුත්වැඩියා කර තිබුණි. එම ඉදිකිරීම් කිසිවක් අළුත්නුවර දේවාලයට පිවිසෙන මාර්ගයට අයත් නොවන බැව්ද යථෝක්ත මුදලින් රු.354,590ක් වැය කර කොන්ක්‍රීට් යොදා ඇති මාර්ගය තනි පුද්ගලයෙකුගේ නිවසකට පිවිසෙන මාර්ගයක් බවද නිරීක්ෂණය විය.

(ඇ) කලවාන සහ පැල්මඩුල්ල විධායක ඉංජිනේරු කාර්යාල විසින් පාසල් 02 ක ක්‍රියාත්මක කරනු ලැබූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 02 කට අදාලව එකතුව රු.1,961,630 ක ප්‍රමාද ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

4.12 ප්‍රමාද වූ ව්‍යාපෘති

අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 06 කට අදාල ඉදිකිරීම් කර්මාන්ත 52 ක් අයහපත් කාලගුණික තත්ත්වය, අමුද්‍රව්‍ය හිඟය සහ ප්‍රමාණවත් කාලයක් ලබා නොදීම හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට නොහැකි වී තිබුණි.

4.13 සම්පූර්ණයෙන් අත්හැර දමා ඇති ව්‍යාපෘති /යෝජනා ක්‍රම

මාර්ග අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ 2012 දෙසැම්බර් 31 දිනට එකතුව රු.10,490,967 ක් වියදම් කරන ලද ඉදිකිරීම් කර්මාන්ත 02 ක් සම්පූර්ණයෙන් අත්හැර දමා තිබුණි.

4.14 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) අධ්‍යාපන ක්ෂේත්‍රයේ අතිරික්තතා හා ඌනතා

2012 දෙසැම්බර් 31 දිනට සබරගමුව පළාත් සභාවේ විදුහල්පතිවරුන් සහ ගුරු භවතුන්ගේ අතිරික්තයන් හා ඌනතාවයන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | රත්නපුර කළාපය | | බලන්ගොඩ කළාපය | | ඇඹිලිපිටිය කළාපය | | නිවිතිගල කළාපය | | කෑගල්ල කළාපය | | මාවනැල්ල කළාපය | | දෙහිඕවිට කළාපය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අති: | ඌණතා | අති: | ඌණතා | අති: | ඌණතා | අති: | ඌණතා | අති: | ඌණතා | අති: | ඌණතා | අති: | ඌණතා |
| විදුහල්පති | | - | 75 | - | 57 | - | 57 | - | 85 | - | 54 | - | 60 | - | 80 |
| ගුරුභවතුන් | 1.ප්‍රාථමික | - | 99 | - | 96 | - | 161 | - | 84 | - | 160 | - | 21 | 118 | - |
| | 2.ද්විතියික | 328 | - | 36 | - | - | 231 | - | 65 | 180 | - | 201 | - | 48 | - |

මේ පිළිබදව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙහිඕවිට අධ්‍යාපන කලාපයේ 2012 දෙසැම්බර් 31 දිනට සිංහල මාධ්‍ය පාසල් 158 ක අනුමත ගුරු සංඛ්‍යාව 2017 ක් වුවද, 2454 ක් සේවයේ යොදවා තිබුණි. සමස්ත අතිරික්තය 437 ක් වූ අතර, එය පාසල් 21 ක ගුරුවරුන් 68 ක ඌනතාවයකින් හා පාසල් 118 ක ගුරුවරුන් 505 ක අතිරික්තයකින්ද සමන්විත වූ බැවින් එය අවිධිමත් ගුරු අනුයුක්ත කිරීම්වල ප්‍රතිඵලයක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ii) නිවිතිගල කළාපයේ ගුරුභවතුන්ගේ පත්වීම් වර්ගීකරණය අනුව 700 දෙනෙකුගේ ඌනතාවයක් සහ ගුරු භවතුන් 501 දෙනෙකුගේ අතිරික්තයක් නිරීක්ෂණය වූ අතර, කළාපය තුළ තුලනය කිරීම් මඟින් ගුරු භවතුන් 244 දෙනෙකුගේ අතිරික්තය සහ ඌනතාවය ඉවත් කළ හැකිව තිබුණ ද එසේ සිදුකර නොතිබුණි.

(iii) කලාප අධ්‍යාපන කාර්යාල 03 කට අදාලව පාසල් 08 ක ප්‍රධාන විෂයයන් සම්බන්ධයෙන් 2011 සහ 2012 වර්ෂයන් හිදී ඌන වූ කාලච්ඡේද සංඛ්‍යාව පිළිවෙලින් 4692 ක් සහ 2226 ක් වූ අතර එය එම පාසල් වල (අ.පො.ස.) සාමාන්‍ය පෙළ විභාග ප්‍රතිඵල පහත වැටීමට හේතු වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අතිරික්තතා හා ඌනතා

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ එක් එක් සේවාවල සේවක අතිරික්තය හෝ ඌනතාවය, විවිධ ආයතන මට්ටමින් පහත දැක්වේ.

| | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | | රත්නපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සහ රත්නපුර දිස්ත්‍රික්කයේ රෝහල් | | කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සහ කෑගල්ල දිස්ත්‍රික්කයේ රෝහල් | | ඇඹිලිපිටිය මූලික රෝහල | |
|---|---|---|---|---|---|---|---|---|
| | අතිරික්තය | ඌනතාව | අතිරික්තය | ඌනතාව | අතිරික්තය | ඌනතාව | අතිරික්තය | ඌනතාව |
| වෛද්‍ය | - | 3 | 54 | 66 | 46 | 57 | - | 25 |
| හෙද | - | 1 | 64 | 79 | 07 | 66 | - | 45 |
| ඖෂධවේදී | - | - | 04 | 19 | - | 10 | - | 15 |
| මහජන සෞඛ්‍ය පරීක්ෂක | - | - | 06 | 08 | - | 30 | - | 01 |
| පවුල් සෞඛ්‍ය සේවක | - | - | 24 | 98 | - | 48 | - | 05 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| තාක්ෂණික | - | - | 06 | 93 | 3 | 9 | - | 13 |
| උපස්ථායක | - | - | 23 | 110 | 25 | 31 | - | 34 |
| කම්කරු | - | 02 | 55 | 294 | 111 | 82 | - | 34 |
| එකතුව | - | 6 | 236 | 767 | 192 | 333 | - | 172 |

4.15 අරමුණුවලට පටහැනි වියදම්

(අ) වී නිෂ්පාදනය කරන කුඹුරු අක්කර 06 කට සහ තවත් වගාබිම් අක්කර 08 කට ජලය සැපයීම අරමුණු කරගෙන මාකුර අමුණ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් විසින් රු. 400,000 ක මුදලක් අනුමත කර තිබුණි. එම අරමුණට පටහැනිව රු.370,272 ක් වැය කර මාකුර ගමට වැටි ඇති මාර්ගයට පැති බැම්මක් ඉදිකර තිබුණි.

(ආ) තිරසාර සංවර්ධනයක් අරමුණු කර ගනිමින් ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් භාවිතා කිරීමත් කෘෂිකර්ම කටයුතු උදෙසා වාරි පහසුකම් සළසා දීමෙන් කෘෂිකාර්මික ඵලදායිතාවය නංවාලීමට පියවර ගැනීමත් ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ මෙහෙවර වී තිබුණද 2012 වර්ෂයේදී රු.3,773,886ක් වැය කර කැගල්ල දිස්ත්‍රික්කයේ මාවත් 25ක් සංවර්ධනය කර තිබූ අතර ඒ පිළිබඳව කරන ලද විගණන පරීක්ෂාවේදී එකී මාවත් බොහොමයක් කෘෂිකාර්මික මාවත් නොවන බව තහවුරු වූයෙන් මූලික අරමුණෙන් බැහැරව ක්‍රියා කර ඇති බැව් නිරීක්ෂණය විය.

(ඇ) සබරගමුව පළාත් සභාවේ 2012 වර්ෂයේ මුදල් ප්‍රකාශය සහ ආදායම් - වියදම් ඇස්තමේන්තුව ප්‍රකාරව නවක ලේඛකයන් දිරිමත් කිරීම සඳහා ප්‍රධාන අමාත්‍යාංශයට රු.1,000,000 ක ප්‍රතිපාදන අනුමත කර තිබූ අතර, එයින් රු.966,000 ක ප්‍රතිපාදන භාවිතා කර සබරගමු පළාත් පාසැල් වලට බෙදාදීම සඳහා දෙමළ මාධ්‍ය ස්තෝත්‍ර පොත් මුද්‍රණය කර තිබුණි.

4.16 වැඩිපුර ගෙවීම්

රඹුක්කන විධායක ඉංජිනේරු කාර්යාලය විසින් කර්මාන්ත 02 ක් වෙනුවෙන් එකතුව රු.70,282 ක මුදලක් ඉටු නොකරන ලද කාර්යයන් වෙනුවෙන් වැඩිපුර ගෙවා තිබුණි.

4.17 අවිධිමත් ගනුදෙනු

(අ) පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් ජපානයේ නිෂ්පාදිත UV1240 මාදිලියේ Photospectometer 6 ක් මිල දී ගැනීම සඳහා 2012 අප්‍රේල් 09 දින රු.4,926,750 ක් ගෙවා තිබුණද ඒ වෙනුවට සිංගප්පූරුවේ නිෂ්පාදිත UV1800 ENG 240V (soft) මාදිලියේ උපකරණ සපයා තිබුණු අතර භාණ්ඩ ලැබීම් පිළිබඳ තාක්ෂණික ඇගයීම් වාර්තාව තුළ ජපානයේ නිෂ්පාදිත බවට සඳහන් කර තිබුණි.

(ආ) පළාත් සභා පාසල් වල ද්වීතියික අධ්‍යාපනය සම්බන්ධව අධ්‍යාපන සංවර්ධනය සඳහා වන වැය විෂයය යටතේ එකතුව රු.108,700 ක් වූ මුදල ජාතික පාසල්වල විදුහල්පතිවරුන් දැනුවත් කිරීම සඳහා වූ වැඩමුළු සඳහා වැය කර තිබුණි.

(ඈ) රත්නපුර නව නගර ගෘහස්ථ ක්‍රීඩාගාරයේ 2012 වර්ෂයේ පවිත්‍රතා සේවාව ලබා ගැනීම වෙනුවෙන් විධිමත් ගිවිසුමකින් තොරව මාස 06 ක් සඳහා ආයතන 02 කට එකතුව රු.103,703 ක් ගෙවීම් කර තිබුණු අතර, රත්නපුර නව නගර ක්‍රීඩාංගනයේ හා ගෘහස්ථ ක්‍රීඩාගාරයේ 2012 වර්ෂයේ ආරක්ෂක සේවාව වෙනුවෙන් ප්‍රසම්පාදන කමිටු තීරණය 2012 අප්‍රේල් මස 04 වන දින ලබා දී තිබුණද 2012

ජනවාරි, පෙබරවාරි, මාර්තු මාස වෙනුවෙන් ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියකින් තොරව රු.116,480ක මුදලක් ගෙවා තිබුණි.

4.18 ප්‍රමාණවත් ලෙස ඉටු නොවූ අරමුණු

(අ) ඇඹිලිපිටිය කලාප අධ්‍යාපන කාර්යාලයේ නොවිධිමත් අධ්‍යාපන ගුරු සිසු පාදක ක්‍රියාකාරකම් සඳහා 2012 වර්ෂයේ රු.325,000 ක ප්‍රතිපාදන සළසා තිබුණ ද ඉන් රු.238,600 ක් දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම සඳහා වැය කර තිබු අතර, ගුරු සිසු පාදක ක්‍රියාකාරකම් කිසිවක් සිදුකර නොතිබුණි.

(ආ) ඇඹිලිපිටිය කලාප අධ්‍යාපන කාර්යාලයේ ප්‍රාථමික සේවා සැපයීම හා ගුරු සිසු පාදක ක්‍රියාකාරකම් වැය විෂයය යටතේ රු.395,000 ක් වැය කර තිබුණ ද ඉන් රු.223,965 ක් ඊට අදාල නොවන අරමුණු සඳහා වැයකර තිබුණි.

5. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

ආයතන 14ක් විසින් 2012 වර්ෂයට අදාලව සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

5.2 ක්‍රියාකාරි සැලැස්ම

ආයතන 06ක් විසින් 2012 වර්ෂයට අදාලව ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

5.3 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

2012 වර්ෂයේදී අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 26 ක් සඳහා එක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් බැගින් ද අමාත්‍යාංශ 02 ක් සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02 බැගින් ද පවත්වා තිබුණි.

5.4 ප්‍රසම්පාදන සැලැස්ම

ආයතන 12ක් විසින් 2012 වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර සබරගමුව පළාත් සභාවේ ආයතන ප්‍රධානීන් හා ප්‍රධාන ලේකම්වරයා දැනුවත් කරන ලදි. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය හා මූල්‍ය පාලනය.

(ආ) වත්කම් හා මානව සම්පත් පාලනය.

(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය.

(ඈ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

(ඉ) පාසල් කළමනාකරණය.